# සිංහල බෞද්ධ නාට්‍ය

පසුගිය සතියේ පළවූ ලිපියෙහි තිබූ වරදක් නිවැරදි කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වෙයි. නාට්‍ය විනිශ්චය සභාවල සිටින අය ගැන සඳහන් කෙරෙන වාක්‍යයක් මෙසේ මුද්‍රණය වී තිබිණි. “එහෙත් ඔවුහු අප මෙන් ප්‍රබුද්ධයෝ වෙති.” ඒ වාක්‍යය පහත සඳහන් අයුරින් නිවැරදි විය යුතු ය. එහෙත් ඔවුහු අප මෙන් නොව ප්‍රබුද්ධයෝ වෙති. ඒ වාක්‍යය එසේ නිවැරදි කිරීම ඉතා වැදගත් වන්නේ මා ප්‍රබුද්ධයකු නොවන බැවින් ය. අද සමාජයේ ප්‍රබුද්ධයන් ලෙස සැලකෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අනුකරනය කරන්නවුන් ය. ඔවුහු සමහරෙක් බටහිර නූතනත්වයට යටවී සිටිති. ඔවුන්ට බටහිර සංකල්පවලින් තොරව හුස්මගැනීමේ අමාරුවක් ද තිබෙන බව පෙනී යයි. මම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අනුකරනය කරන්නෙක් නො වෙමි. අද මෙරට බටහිර නූතනත්වයේ විවිධ නියෝජිතයෝ වෙති. ඔවුන් කරන්නේ බටහිර නූතනත්වයේ අඟවල් රීතිය, අඟවල් නාට්‍යය, අඟවල් වාදය හා අඟවල් කොංගෙඩිය ඊනියා සිංහල පාඨකයාට හඳුන්වාදීම ය. ඒ අඟවල් අඟවල් භාණ්ඩ වෙළෙඳපොළට හඳුන්වාදෙන වෙළෙඳ නියෝජිතයන් හෙවත් ඔවුන්ගෙ භාෂාවෙන් නම් සේල්ස් රෙප්ලා මෙන් ය. මේ ප්‍රබුද්ධයෝ ද සේල්ස් රෙප්ලා වෙති. ඔවුහු ප්‍රබුද්ධ සේල්ස් රෙප්ලා වෙති.

විවිධ නාට්‍ය ගැන අපි දනිමු. සංස්කෘත නාට්‍ය, ග්‍රීක නාට්‍ය, ශේක්ෂ්පියර් නාට්‍ය, නෝ නාට්‍ය, ආදී වශයෙන් නාට්‍ය වර්ගීකරණයක් වෙයි. ඒ අතර විවිධ රංග රීති ද වෙයි. ඔබ අර රංග රීතිය හෝ මේ රංග රීතිය හෝ දන්නේ දැයි ප්‍රබුද්ධයකු ඇසීමට ඉඩ ඇත. ඇතැමුන්ට අනුව පශ්චාත්නූතනවාදී නාට්‍ය ද වෙයි. මෙලෙස කියන්නන් ජීවත්වන්නේ පශ්චාත්නූතනවාදීන් ලෙස ද? සමාජයේ ජීවත්වන පශ්චාත්නූතනවාදී ක්‍රමයක් වේ ද? පශ්චාත්නූතනවාදියකු හඳුනාගැනීමට ඇති නිර්ණායක කවරේ ද? බටහිර පළවී ඇති ඊනියා පශ්චාත්නූතනවාදී මත කිහිපයක්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ භාෂාවෙන් කියන්නේ නම් ගිරවාදැමීම, (මෙය දිරවාදැමීම ලෙස මුද්‍රණය වේ දැයි මට සැකයක් වෙයි. මොවුන්ට ඇති ප්‍රශ්නය ද කසිකබල් “පශ්චාත්නූතනවාදී” මත දිරවාගැනීමට නො හැකි වීම ය.), හැරෙන්නට මොවුන් දන්නේ කුමක් ද? ඔවුන්ගේ ගෙවල්වල ඇත්තේ පශ්චාත්නූතනවාදී ජීවන ශෛලියක් ද?

එහෙත් මූලික ප්‍රශ්නය නම් පශ්චාත්නූතනත්වයක් ඇත් ද යන්න ය. සේල්ස් රෙප්ලා වූ එක්ස් කණ්ඩායමේ හා තවත් අනුකාරකයන් කිහිප දෙනකුට වැළඳී ඇති “හිස්ටීරියාව” හේතුවෙන් ඔවුහු පශ්චාත්නූතනත්වයක් ඇතැයි සලකති. එහෙත් ලියෝතාර්ද්ගේ පශ්චාත්නූතනත්ව අවශ්‍යතා එකක්වත් සම්පූර්ණ වී නැති බවත් බෞද්රියාගේ විඩම්බිත (සිමියුලේක්‍රම්) විලම්බිතයක් පමණක් බවත් පෙන්වීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පසුපස දිවයන ඕල්කට් බෞද්ධයනට කෙසේ වෙතත් සිංහල බෞද්ධයනට නම් අහස පොළොව ගැටගසන ප්‍රශ්නයක් නො වෙයි. පශ්චාත්නූතනත්වයක් නැති විට පශ්චාත්නූතන නාට්‍ය ඇත්තේ කොහේ ද?

මෙරට පමණක් නොව ලෝකයේ කොතැනත් ඇත්තේ පක්ෂපාතී සාහිත්‍ය විචාරයකි. පක්ෂපාතී නාට්‍ය විචාරයකි. එයට මම දොස් නො කියමි. කලින් සඳහන්කළ අයුරින් මම ද පක්ෂපාතී වෙමි. මා පක්ෂවන්නේ කුමකට දැයි මම කෙලින් ම කියමි. ඒ සඳහා මට ආත්ම විශ්වාසයක් ඇත. එහෙත් මේ කසිකබල් ප්‍රබුද්ධයෝ පක්ෂපාතීවන අතරම තමන් අපක්ෂපාතී යැයි මොරගා හඬදෙති. මෙරට කසිකබල් ප්‍රබුද්ධයෝ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට තමන්ගේ ඇති පක්ෂපාතීත්වය කිසිවිටෙකත් නො කියති. කිසිම රටක නාට්‍ය කලාව හෝ ගණිතය හෝ වෙනත් ඉටිගෙඩියක් හෝ දේශපාලනයෙන් මුළුමනින් ම තුරන් නො වෙයි. අප රටේ අද සියල්ල පාහේ තීරණය වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යන පසුබිමෙහි දෙමළ ජාතිවාදය ජයග්‍රහණය කරවීම යන්නට සාපේක්ෂව ය. නාට්‍ය විනිශ්චය සභාවෙහි සාමාජිකයන් දෙමළ ජතිවාදය සම්බන්ධයෙන් දරණ මත ප්‍රකාශ කළහොත් ඔවුන්ගේ විනිශ්චයට බලපා ඇති සාධක හුදී ජනයාට ද දැනගත හැකිවනු ඇත. ඔවුන්ගෙන් කී දෙනකු ඊනියා රාජ්‍ය නොවන සංවිධානවලින් මුදල් ලබන්නේ ද හෝ ඔවුන් කී දෙනකු පොංගු තමිල් සමග සිටියේ ද යන්න හෝ අදාළ ප්‍රශ්න වුව ද අපට ඒ දැනගැනීමට අවශ්‍ය නැත. උතුර හා නැගෙනහිර ගැන ඔවුන් දරන්නේ කිනම් මතයක් ද යන්න පමණක් අපට ප්‍රමාණවත් වෙයි. මා බිම්බා නාට්‍යය නැරඹුවේ දෙමළ ජාතිවාදය පිළිබඳ ව පමණක් නොව බටහිර ගණිතයේ හා භෞතික විද්‍යාවේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි සම්භවය පිළිබඳ මා දරණ අදහස් රඟහලෙහි එළිපත්තෙහි තබා නොවන බව කීමට මට දෙවරක් සිතිය යුතු නො වෙයි.

© Prof. Nalin De Silva

අප බොහෝවිට කියා ඇති කරුණක් නම් මෙරට ඊනියා ජාතික හා ජාත්‍යන්තර සම්මාන ඉතා වැඩි වශයෙන් පිරිනැමෙන්නේ සිංහල බෞද්ධත්වයට පහර දෙන කෘතිවලට බව ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අවශ්‍යතාව එසේ පහරදීම වූවිට සිංහල බෞද්ධ නාට්‍යයක් රාජ්‍ය නාට්‍ය උළෙලින් දෙවැනි වටයේ දීම ඉවත්කිරීම මහා අරුමයක් නො වෙයි. මගේ කිසිම පොතකට කිසිම සම්මානයක් කිසි දා හිමි වී නැත. මා කිසිම සම්මානයක් සඳහා ඉදිරිපත්වීත් නැත. කේ බී හේරත් මහතා තම බිම්බා නම් වූ යසෝදරා නාට්‍යය අභවල් දෙයකට මේ නාට්‍ය උළෙලට ඉදිරිපත් කෙළේ දැයි මම නො දනිමි. ඔහු කළ යුතු ව තිබුණේ රාජ්‍ය නාට්‍ය උළෙල අළුයම ලූ කෙළ පිඬක් මෙන් සැලකීම ය. මම ඉතා කෙටියෙන් ප්‍රශ්නයක් අසමි. පටිච්ච සමුප්පාදයට වතිකානුවෙන් තෑග්ගක් ලැබේ ද? නැත්නම් කැන්ටබරියේ ආච් බිෂොප්තැනගෙන් තෑග්ගක් ලැබේ ද? කැන්ටබරියේ ආච් බිෂොප් යනු කවුදැයි ප්‍රබුද්ධයන් දන්නේ දැයි මම නො දනිමි. බ්‍රිතානීන් කෙතරම් කපටි රාජ්‍ය පාලකයන්දැයි කිවහොත් දෙවැන්නට නම් ඉඩක් නැතුවාද නො වෙයි.

බිම්බා නාට්‍යයෙහි මා දුටු වැදගත් කරුණු බොහොමයක් වෙයි. ඒ සියල්ල මෙහි දී කීමට නො හැකි ය. අවස්ථාවක් ලදහොත් කැලණිය විශ්වවිද්‍යාලයේ දී ඒ පැවසීමට බලාපොරොත්තු වෙමි. බිම්බා යනු සිංහල බෞද්ධ නාට්‍යයකි. මා එසේ කියන්නේ එහි කතා වස්තුව බෞද්ධ වීම නිසා නො වෙයි. ක්‍රිස්තියානි හෝ ග්‍රීක හෝ වෙනත් කතා වස්තුවක් ද ගෙන සිංහල බෞද්ධ නාට්‍යයක් නිෂ්පාදනය කළ හැකි ය. එමෙන් ම බෞද්ධ කතාවස්තු ගෙන බටහිර නාට්‍යයක් හෝ සංස්කෘත නාට්‍යයක් හෝ නිෂ්පාදනය කළ හැකි ය. බිම්බා නාට්‍යයෙහි සිංහල බෞද්ධ නාට්‍යයක තිබිය හැකි ලක්ෂණ වෙයි. මේ නිසා ම ඒ නාට්‍යයක් දැයි ඇතැම් ප්‍රබුද්ධයකුට ප්‍රශ්නයක් විය හැකි ය. ප්‍රබුද්ධයකුට හෝ ප්‍රබුද්ධියකට හෝ සංස්කෘත නාට්‍යය ඇතැම් විටෙක දිරවාගත නොහැකි වුව ද එවැනි නාට්‍ය තිබෙන බව පිළිගත හැකි ය. එයට හේතුව අන්කිසිවක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ විශ්වවිද්‍යාල හා නාට්‍ය විචාරකයන් එවැනි නාට්‍ය තිබෙන බව පිළිගෙන තිබීම ය. එහෙත් සිංහල බෞද්ධ නාට්‍ය තිබෙන බව ඇත්තේ මොන පොතේ ද? පොතක නැති දෙයක්, විශේෂයෙන් ම ඉංගිරිසි පොතක නැති දෙයක් තිබිය හැකි ද? සියල්ලට පළමු වචනය වී ය යන අර්ථය දෙන කියමනක් පරණ තෙස්තමේන්තුවේ ඇත. සියල්ලට පළමු යමක් ඉංගිරිසි පොතක සඳහන් විය යුතු ය .

වත්මන් සිංහල බෞද්ධ නාට්‍ය කලාව තවමත් ඇත්තේ ළදරු වියෙහි ය. මේ ප්‍රකාශයත් සමග ඇතැම් ප්‍රබුද්ධයන් උද්දාමයට පත්වනු ඇත. ඔය කියන්නේ සිංහල බෞද්ධ නාට්‍ය කලාවක් තිබී නැති බව නොවේ දැයි ප්‍රබුද්ධයා හෝ ප්‍රබුද්ධිය හෝ උදම් අනනු ඇත. ප්‍රබුද්ධයන් හා ප්‍රබුද්ධියන් ඉක්මන් නොවිය යුතු ය. මෙරට ගණිතයක් හා භෞතික විද්‍යාවක් නොතිබිණි ද? ඒ විද්‍යාව උම්මග්ග ජාතකයෙහි ද දැකගත හැකි ය. එහෙත් අපි මෙරට වර්තමානයෙහි සිංහල බෞද්ධ ගණිතයක් හා භෞතික විද්‍යාවක් ගොඩනගාගැනීමට කටයුතු කරමු. ඒ ශාස්ත්‍ර හා විද්‍යා නම් ළදරු වියෙහිවත් නැත. තවමත් ඒ ඇත්තේ කළලයක් ලෙස ගැබෙහි ය. එහෙත් අපි සිංහල බෞද්ධ භෞතික විද්‍යාවක් මගින් ක්වොන්ටම් භෞතිකයේ න්‍යායත් (logic) විශ්වයේ ප්‍රසාරණයත් තේරුම් ගැනීමට උත්සාහ කරමු.ලබන සතියේ කැළණිය විභව විද්‍යාලයේ පැවැත්වෙන විද්‍යා ප්‍රදර්ශනයෙහි දී මේ කළලයෙහි ඇතැම් අංග දැකගැනීමට හැකිවනු ඇත. ඒ ස්කෑන්කිරීමෙන් දැයි ප්‍රබුද්ධියක ඇසුවහොත් කීමට ඇත්තේ ගැබ දැනගන්නා වෙනත්  ක්‍රම ද ඇති බව ය.

සිංහල නාට්‍ය සම්බන්ධයෙන් සරච්චන්ද්‍ර මහතා කර ඇති අධ්‍යයන වැදගත් වෙයි. එහෙත් සිංහල ගැමි නාටකය යනු ඒ සම්බන්ධයෙන් ලියන ලද අවසාන වාක්‍යය නො වෙයි. සිංහල නාඩගමේ සම්භවය සම්බන්ධයෙන් ඒ මහතා ලියා ඇති කරුණු ද විමසිය යුතු ය. අපට නාඩගම ලැබුණේ ක්‍රිස්තියානි සංස්කෘතිය ඔස්සේය යන්න පිළිගත නොහැකි බවට මහාචාර්ය දැළ බණ්ඩාර මහතා පවසන අදහස් ඉතා වැදගත් වෙයි. එසේම සිංහල සංස්කෘතිය සම්බන්ධයෙන් මීගස්කුඹුර, පල්ලියගුරු, දනන්සූරිය ආදී මහාචාර්යවරුන් දක්වන අදහස් අපේ සැලකිල්ලට යොමු විය යුතු ය. ප්‍රබුද්ධයන්ගේ සැලකිල්ලට භාජනය නොවුණ ද ගුණදාස අමරසේකර මහතා මෑතක දී පළකළ අසක්දා කව ද සිංහල බෞද්ධ නාට්‍ය කලාව සම්බන්ධයෙන් වැදගත් වෙයි. අපේ කාව්‍ය සම්ප්‍රදාය ම නාට්‍ය සම්ප්‍රදායක් නො වේදැයි විමසිය යුතු ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි කාව්‍යය නාට්‍යයෙන්වත් නාට්‍යය කාව්‍යයෙන්වත් වෙන් කළ හැකි ද? නාට්‍යයක තිබිය යුතු යැයි සංස්කෘත නාට්‍ය කරුවන් හෝ ග්‍රීක නාට්‍යකරුවන් හෝ වෙනත් අය කියන සියළු අංග සිංහල බෞද්ධ නාට්‍යයවල ද තිබිය යුතුම ද? අප ඉන් ගත යුත්තේ කිනම් අංග ද ඉවත්කළ යුත්තේ කිනම් කොටස් ද?

© Prof. Nalin De Silva